# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය , බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1630/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 24/10/2024<br>පැය 1242 |

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු ජන මාධ්‍ය වෙත යොමු කිරිම.**

**01. නීති විරෝධීව ලෙස මෙරටට රැගෙන ආ දුම්වැටි තොගයක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය.**

2024.10.23 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මීගමුව පොලිස් වසමේ මීගමුව ප්‍රදේශයේ වැටලීමක් සිදුකර මෙරට නීති විරෝධීව තිරුබදු රහිතව ගෙන්වන ලද රූපමය අවවාද නොමැති දුම්වැටි 6000 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරු මීගමුව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 22 ක් පුත්තලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. මීගමුව පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**02. බලපත්‍ර නොමැතිව ට්‍රැක්ටර් රථයකින් බොරළු ප්‍රවාහනය කළ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මුලතිව් කඳවුර.**

2024.10.23 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මුලතිව් කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ඔඩ්ඩුසුඩාන් පොලිස් වසමේ තන්ඩුවාන් රක්ෂිත ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර බලපත්‍ර නොමැතිව ට්‍රැක්ටර් රථයකින් බොරළු ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඔඩ්ඩුසුඩාන් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වූ මුලතිව් ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** ඔඩ්ඩුසුඩාන් පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. බලපත්‍ර නොමැතිව විදේශීය රටක නිෂ්පාදිත ගිනි අවියක් සහ මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුර.**

2024.10.23 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් පුත්තලම පොලිස් වසමේ කොට්ටුකච්චිය ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **විදේශීය රටක නිෂ්පාදිත ගිනි අවියක් සහ මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙක් අත්අඩංගුවට** ගෙන පුත්තලම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු** 23 **ක් වන** කොට්ටුකච්චිය **ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

පුත්තලම පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**